සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**2563 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2019 දෙසැම්බර්**

**NEW**

(නව නිර්දේශය)

**07 S I, II**

**(07) ඉතිහාසය - I, II**

පැ තුනයි

**2019.12.24 /12.30 - 15.40**

අමතර කියවීම් කාලය -මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**ඉතිහාසය - I පත්‍රය**

සැලකිය යුතුයි :

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු **40** ක් ලැබේ.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

● අංක **1** සිට **15** තෙක් එක් එක් ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න. *(ලකුණු 01 × 40 = 40 යි)*

1. වංසත්ථප්පකාසිනී ටීකා ග්‍රන්ථය රචනා කිරීමට මූලාශ්‍රය වී ඇත්තේ,
   (1) දීපවංසයයි. (2) මහාවංසයයි.
   (3) සීහලට්ඨකථා මහාවංසයයි. (4) ථූපවංසයයි.

2. ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමට උපකාරී වන පහත සඳහන් පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය අතුරෙන් ආගමික නොවන මූලාශ්‍රය කුමක් ද?
   (1) සඳකඩපහණ (2) රාජසභා ගොඩනැගිලි
   (3) දාන ශාලා (4) බෝධිඝර

3. මහවැලි, කැලණි, කළු සහ වලවේ යන සිව්මහා ගංගා ආරම්භ වන කඳු පන්තිය වන්නේ,
   (1) නමුණුකුල ය. (2) පිදුරුතලාගල ය (3) කිරිගල්පොත්ත ය. (4) සමනල ය.

4. තිසාවැව සහ වලස්වැව ඉදි කළේ කුමන රජුගේ කාලයේ දී ද?
   (1) දේවානම්පිය තිස්ස (2) සද්ධාතිස්ස
   (3) කාවන්තිස්ස (4) දුටුගැමුණු

5. අනුරාධපුර නගරය සැලසුම් කළ වාස්තු විද්‍යාඥයා කවරෙක් ද?
   (1) පණ්ඩුල (2) ගිරිකණ්ඩ සිව (3) මිගාර (4) ජෝතිය

6. ශ්‍රී පාදස්ථානයට ගමන් ගන්නා බැතිමතුන් සඳහා දන්සැල් ඉදි කළ රජතුමා කවරෙක් ද?
   (1) ධාතුසේන (2) පළමුවන විජයබාහු (3) මහාපරාක්‍රමබාහු (4) නිශ්ශංකමල්ල

7. ඉබන්බතුතා ශ්‍රී ලංකාවට පැමිණෙන විට ආර්ය චක්‍රවර්තීන් පාලනය කළ ප්‍රදේශය කුමක් ද?
   (1) යාපනය (2) පොළොන්නරුව (3) දඹදෙණිය (4) යාපහුව

8. 1818 නිදහස් අරගලයේ නායකත්වය ගෙන කටයුතු කළේ කවරෙක් ද?
   (1) ගොංගාලේගොඩ බණ්ඩා (2) මොණරවිල කැප්පෙටිපොල
   (3) වීරපුරන් අප්පු (4) මඩුගල්ලේ දිසාව

9. ජනතාවටත්, රටටත් සෞභාග්‍යය ලබාදෙන මන්ත්‍ර සජ්ඣායනය මුල්කරගත්, බුදුදහම ව්‍යාප්ත වූ රට කුමක් ද?
   (1) කොරියාව (2) බුරුමය (3) ජපානය (4) ඉන්දුනීසියාව

10. බුරුමයේ 'ස්වේදගොන් (Shwedagon)' චෛත්‍යය ගොඩනගන ලද පාලකයා කවු ද?
   (1) සිටු රජු (2) ධම්මචේතිය රජු (3) අනුරුද්ධ රජු (4) ක්‍යාන්සිත්ථ රජු

11. ශ්‍රේෂ්ඨ ග්‍රීක මහා කාව්‍ය දෙකක් වූ 'ඉලියඩ් සහ ඔඩිසි' රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?
   (1) පිණ්ඩාර් (2) සැෆෝ (3) වර්ජිල් (4) හෝමර්

12. දඹදෙණිය පාලන මධ්‍යස්ථානය බවට පත් කර ගත් ප්‍රථම පාලකයා කවු ද?
   (1) තුන්වන විජයබාහු (2) දෙවන පරාක්‍රමබාහු
   (3) පළමුවන බුවනෙකබාහු (4) තුන්වන වික්‍රමබාහු

13. කුසුමාසන දේවිය විවාහ කර ගනිමින් කන්ද උඩරට පාලකයා වූයේ,
   (1) වීරසුන්දර බණ්ඩාර ය. (2) කොනප්පු බණ්ඩාර ය.
   (3) යමසිංහ බණ්ඩාර ය. (4) සේනාසම්මත වික්‍රමබාහු ය.

14. යාපනයේ තේසවලාමෙ නීති ක්‍රමය යාවත්කාලීන කර ක්‍රියාත්මක කරවන ලද්දේ කවුරුන් විසින් ද?
   (1) චෝළයන් (2) පෘතුගීසීන් (3) ලන්දේසීන් (4) ඉංග්‍රීසීන්

15. ඔලිම්පික් ක්‍රීඩාවේ ආරම්භය සිදු වූයේ,
   (1) බැබිලෝනියාවේ ය. (2) සුමේරියාවේ ය.
   (3) ග්‍රීසියේ ය. (4) රෝමයේ ය.

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් ලබා දී ඇත. ඒවා අතුරින් එක් නමක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නාමය තෝරන්න.

16. (1) තෝපාවැව (2) දුඹුටුලු වැව (3) කලාවැව (4) එරමුදුවැව

17. (1) අනගාරික ධර්මපාල (2) හෙන්රි ස්ටීල් ඕල්කට්
   (3) බ්‍රහ්මචාරී වලිසිංහ හරිස්චන්ද්‍ර (4) සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර

18. (1) සීගිරිය (2) බලන (3) හපුතලේ (4) ගලගෙදර

19. (1) මාණාභරණ (2) කිත්සිරි මේඝ (3) සිරිවල්ලභ (4) පළමුවන විජයබාහු

20. (1) අංග (2) මගධ (3) බරණැස (4) කාසි

[ 3 වැනි පිටුව බලන්න.

● අංක **21** සිට **25** තෙක් ප්‍රශ්නවල නාම/ප්‍රකාශන යුගල හතර බැගින් ලබා දී ඇත. ඒවා අතුරින් එක් නාම/ප්‍රකාශන යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන නාම/ප්‍රකාශන යුගලය තෝරන්න.

21. (1) කාවන්තිස්ස - විහාරමහා දේවිය
(2) වළගම්බා - සෝමාදේවිය
(3) පළමුවන විජයබාහු - ලීලාවතී කුමරිය
(4) මහා පරාක්‍රමබාහු - සුගලා දේවිය

22. (1) අමාවතුර - පොලොන්නරුව
(2) පූජාවලිය - අනුරාධපුරය
(3) තිසර සන්දේශය - ගම්පොල
(4) දළදා පූජාවලිය - කුරුණෑගල

23. (1) කාම්බෝජය - ලිදයිය රජු
(2) ඉන්දුනීසියාව - විජයෝත්තුංග රජු
(3) කොරියාව - පෙක්චේ රජු
(4) ජපානය - සුයිකෝ අධිරාජිනිය

24. (1) පැරකුම්බා පිරිවෙන - කෝට්ටේ
(2) ශ්‍රී සණානන්ද පිරිවෙන - රයිගම
(3) පද්මාවති පිරිවෙන - කෑරගල
(4) ඉරුගල්කුලතිලක පිරිවෙන - පැපිලියාන

25. (1) යුද්ධයට අධිපති දෙවියා - මාර්ස්
(2) මුහුදට අධිපති දෙවියා- නෙප්චූන්
(3) අහසට අධිපති දෙවියා- වීනස්
(4) අස්වැන්නට අධිපති දෙවඟන - සෙරෙස්

● අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා *(A)*, *(B)*, *(C)* හා *(D)* යන ප්‍රතිචාර හතරක් දී ඇත. ඒවා අතුරෙන් දෙකක් නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාර දෙක තෝරා,

*(A)* සහ *(B)* පමණක් නිවැරදි නම්, අංක **1** ද,
*(B)* සහ *(C)* පමණක් නිවැරදි නම්, අංක **2** ද,
*(C)* සහ *(D)* පමණක් නිවැරදි නම්, අංක **3** ද,
*(A)* සහ *(D)* පමණක් නිවැරදි නම්, අංක **4** ද,

සලකුණු කරන්න.

26. ශ්‍රී ලංකාව ඉන්දියාවට ආසන්නව පිහිටීම නිසා ඇතිවූ බලපෑම් සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ නිවැරදි වේ ද?
*(A)* – දකුණු ඉන්දියානු ආක්‍රමණ ඇතිවීම
*(B)* – ලංකාව ස්වාධීන රාජ්‍යයක් වශයෙන් වර්ධනය වීම
*(C)* – ඉන්දියාවෙන් අතුරුදහන් වුවත්, බුදුදහම ශ්‍රී ලංකාව තුළ මුල් බැස ගැනීම
*(D)* – ඉන්දියානු සිරිත්විරිත්, ආගමික ඇදහිලි, විශ්වාස ශ්‍රී ලාංකික සමාජය කෙරෙහි බලපෑම

27. දේවානම්පියතිස්ස රාජ්‍ය සමය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ නිවැරදි වේ ද?
*(A)* – බසවක්කුලම වැව ඉදි කිරීම
*(B)* – ලෝවාමහාපාය ඉදි කිරීම
*(C)* – ශ්‍රී මහා බෝධිය වැඩම කිරීම
*(D)* – මෞර්ය අභිෂේක ක්‍රමය ක්‍රියාත්මක කිරීම

28. වජ්ජි රාජ්‍යයේ ලිච්ඡවී පාලකයින් අනුගමනය කළ සප්ත අපරිහානි ධර්මය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ නිවැරදි වේ ද?
*(A)* – නිතර නිතර රැස්වී සාකච්ඡා කිරීම
*(B)* – සමගිව රැස්වීම හා සමගිව විසිරී යාම
*(C)* – සියලු වැඩිහිටි පුරවැසියන් පාලනයට සම්බන්ධ වීම
*(D)* – අස්වැන්න සම සමව බෙදා ගැනීම

[ 4 වැනි පිටුව බලන්න.

29. චීනයේ බුදුදහම ව්‍යාප්තවීම සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ නිවැරදි වේ ද?

(*A*) – රජපවුලේ දරුවන් සසුන්ගත වීම

(*B*) – බෞද්ධ සූත්‍ර මඟින් අපල උපද්‍රව දුරුවන බව ප්‍රචලිත වීම

(*C*) – වෙළෙඳුන්ගෙන් හා සංචාරකයන්ගෙන් ආගම ප්‍රචාරය වීම

(*D*) – නවවන ශතවර්ෂය වනවිට රාජ්‍ය ආගම බවට පත් වීම

30. ඇළ මාර්ග නිර්මාණයේ දී පැරණි වාරි ශිල්පීන්ගේ තාක්ෂණික දැනුම සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ නිවැරදි වේ ද?

(*A*) – ඇළ මාර්ගවල අතිරික්ත ජලය හා රොන්මඩ ඉවත් කිරීමට සොරොව් ඉදි කිරීම

(*B*) – බෑවුම් සහිත ප්‍රදේශවලින් ජලය ගලායාමේ දී එහි වේගය පාලනය කිරීමට ගල් කණු සවි කිරීම

(*C*) – සුළු බෑස්මක් ඔස්සේ විශාල දුරකට ජලය ගෙන යාම

(*D*) – සියළු ඇළ මාර්ග දෙපස කළුගල් තට්ටු අතුරා ඉවුරු ඛාදනය වැළැක්වීම

- අංක **31** සිට **35** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම/ප්‍රකාශන සමූහයක් ***X*** හා ***Y*** තීරුවල ඇත. ***Y*** තීරුවේ ඇති නාම/ප්‍රකාශන ***X*** තීරුවේ ඇති නාම/ප්‍රකාශන සමග කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. ***Y*** තීරුවේ ඒවා ***X*** තීරුවේ අනුපිළිවෙළට සකස් කළ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

31.

| *X* | *Y* |
|---|---|
| (1) පළමුවන විජයබාහු | *A* – අනුරාධපුරය |
| (2) පළමුවන විමලධර්මසූරිය | *B* – පොළොන්නරුව |
| (3) මායාදුන්නේ | *C* – මහනුවර |
| (4) පණ්ඩුකාභය | *D* – සීතාවක |

(1) *A, D, B, C* (2) *D, A, C, B* (3) *B, C, A, D* (4) *B, C, D, A*

32.

| *X* | *Y* |
|---|---|
| (1) ප්ලිනි | *A* – අරාබි ජාතිකයෙකි |
| (2) ඉබන් බතුතා | *B* – චීන ජාතිකයෙකි |
| (3) මෙගස්තිනීස් | *C* – රෝම ජාතිකයෙකි |
| (4) ෆාහියන් | *D* – ග්‍රීක ජාතිකයෙකි |

(1) *A, D, C, B* (2) *C, B, A, D* (3) *C, A, D, B* (4) *D, C, A, B*

33.

| *X* | *Y* |
|---|---|
| (1) සිඛවළඳ හා සිඛවළඳවිනිස | *A* – පොළොන්නරුව |
| (2) කව්සිළුමිණ | *B* – කෝට්ටේ |
| (3) කාව්‍යශේඛරය | *C* – අනුරාධපුරය |
| (4) අමාවතුර | *D* – දඹදෙණිය |

(1) *A, D, C, B* (2) *B, A, D, C* (3) *C, A, B, D* (4) *C, D, B, A*

34.

| *X* | *Y* |
|---|---|
| (1) ඩේරියස් | *A* – ඇතන්ස් |
| (2) පෙරික්ලීස් | *B* – රෝමය |
| (3) මහා ඇලෙක්සැන්ඩර් | *C* – පර්සියාව |
| (4) ඔගස්ටස් සීසර් | *D* – මැසිඩෝනියාව |

(1) *A, B, C, D* (2) *C, A, D, B* (3) *C, D, B, A* (4) *D, C, A, B*

[ 5 වැනි පිටුව බලන්න.

35. 

| | X | | Y |
|---|---|---|---|
| (1) | වසභ රජු | A – | යෝධ ඇළ |
| (2) | මහසෙන් රජු | B – | ඇළහැර ඇළ |
| (3) | පළමුවන අග්බෝ රජු | C – | මිණිපේ අමුණ |
| (4) | ධාතුසේන රජු | D – | පබ්බතන්ත ඇළ |

(1) *A, D, C, B* (2) *B, A, D, C* (3) *B, D, A, C* (4) *B, D, C, A*

● අංක **36** සිට **40** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. ඒ ඒ ප්‍රශ්නයට අදාළව දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන කුමන ප්‍රකාශ යුගලය දැයි තෝරා, එහි අංකය සලකුණු කරන්න.

| වරණ අංකය | පළමුවන ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2 | නිවැරදි ය. | වැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 36. | පණ්ඩුකාභය රජු බ්‍රාහ්මණයන්ට යාගහෝම පැවැත්වීම සඳහා සිවිකාශාලා සහ සොත්ථිසාලා ඉදිකොට ඇත. | දුටුගැමුණු රජතුමා විසින් ථූපාරාමය ඉදි කරන ලදී. |
| 37. | පළමුවන පරාක්‍රමබාහු රජු කාලිංග මාඝගෙන් රජරට නිදහස් කර ගත්තේ ය. | තුන්වන විජයබාහු රජු දඹදෙණියේ විජයසුන්දරාරාමය ඉදිකරවීය. |
| 38. | කෝට්ටේ, අවසාන සිංහල රාජධානියයි. | සපුමල්කුමරු යාපන රාජධානියේ ආරම්භක පාලකයා වේ. |
| 39. | පෘතුගාලයේ නාවික හෙන්රි කුමරු දේශගවේෂණ ව්‍යාපාරයේ පුරෝගාමියා විය. | වස්කෝදගාමා අප්‍රිකාව වටා යාත්‍රාකොට ඉන්දියාවේ කැලිකට් වරායට ළඟා විය. |
| 40. | කෝල්බෲක් ආණ්ඩුක්‍රමය මඟින් සර්වජන ඡන්දබලය ප්‍රදානය කරන ලදී. | සොල්බරි ආණ්ඩුක්‍රමය යටතේ ද්වි මණ්ඩල ව්‍යවස්ථාදායකයක් හඳුන්වා දෙන ලදී. |

* *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**NEW** **2563 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2019 දෙසැම්බර්**

**(නව නිර්දේශය)**

**07 | S | I, II**

**(07) ඉතිහාසය - I, II**

**ඉතිහාසය - II පත්‍රය**

* පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

**1.** (i) ඔබට සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කර නම් කරන්න.

**(ඇමුණුම 01)**


1. දඹකොළපටුන    2. මහාතිත්ථ    3. අනුරාධපුර
4. ගල්ඔය    5. මහනුවර    6. ගාල්ල

*(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි.)*

● පහත දී ඇති ***A*** හා ***B*** රූප සටහන් අධ්‍යයනය කොට, ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) (අ) ***A*** වලින් දැක්වෙන රූපය කුමක් ද?
(ආ) මෙම නිර්මාණය පිහිටි ඓතිහාසික නගරය කුමක් ද?
(ඉ) මෙම නිර්මාණය ඉදිකරවන ලද රජතුමා කවරෙක් ද?


*(ලකුණු 03 යි)*



***A***

(iii) (අ) ***B*** වලින් දැක්වෙන්නේ කුමක් ද?
(ආ) මෙම නිර්මාණය පිහිටි රට කුමක් ද?
(ඉ) මෙය ගොඩනගන ලද්දේ කවුරුන් විසින් ද?

*(ලකුණු 03 යි)*



***B***

**2.** (i) ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීම සඳහා උපයෝගී කරගත හැකි විදේශීය සාහිත්‍ය මූලාශ්‍රය දෙකක් නම් කරන්න.

*(ලකුණු 02 යි)*

(ii) ඉතිහාසය ගොඩනගා ගැනීම සඳහා සාහිත්‍ය මූලාශ්‍රය භාවිතයේ දී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් සඳහන් කරන්න.

*(ලකුණු 04 යි)*

(iii) ඉතිහාසය ඉගෙනීමෙන් ලබාගත හැකි ප්‍රයෝජන තුනක් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

[ 7 වැනි පිටුව බලන්න.

**3.** (i) විජය ඇතුළු පිරිස මෙරට ජනාවාස පිහිටුවාගත් ස්ථාන දෙකක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) ඉන්දියානු සංක්‍රමණික ජන කණ්ඩායම් තම ජනාවාස පිහිටුවා ගැනීමේදී වියළි කලාපය තෝරා ගැනීමට තුඩු දුන් හේතු දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

(iii) පණ්ඩුකාභය රාජ්‍ය සමය මෙරට ඉතිහාසයේ වැදගත්වීමට හේතු දෙකක් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

**4.** (i) පොලොන්නරුව හැඳින්වූ වෙනත් නම් දෙකක් ලියන්න. *(ලකුණු 02 යි)*

(ii) පළමුවන විජයබාහු රජු තම පාලන මධ්‍යස්ථානය ලෙස පොලොන්නරුව තෝරා ගැනීමට තුඩු දුන් හේතු දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

(iii) පළමුවන විජයබාහු රජතුමාගේ ආගමික සේවාව කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

**5.** (i) පොළොන්නරු රාජධානිය බිඳවැටීමෙන් පසු බිහි වූ නිරිතදිග රාජධානි දෙකක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) නිරිතදිග රාජධානි බිහිවීමට තුඩු දුන් හේතු දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

(iii) නිරිතදිග රාජධානි සමයේ මෙරට ආර්ථික ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්වීම් අංශ දෙකක් යටතේ පැහැදිලි කරන්න *(ලකුණු 06 යි)*

**6.** (i) පෘතුගීසීන් හා උඩරට රාජධානිය අතර ඇති වූ සටන් දෙකක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) පෘතුගීසීන්ගේ උඩරට ආක්‍රමණ අසාර්ථකවීමට තුඩු දුන් හේතු දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

(iii) පෘතුගීසීන් මෙරටට පැමිණීමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලාංකික සමාජයට එකතු වූ නවාංග දෙකක් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

**7.** රෝම ශිෂ්ටාචාරය පහත සඳහන් මාතෘකා දෙක ඇසුරෙන් විස්තර කරන්න.

(i) රෝම සමාජය

(ii) රෝම ආර්ථිකය *(ලකුණු 06 × 2 = 12 යි)*

**8.** පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකක් පිළිබඳ ඓතිහාසික සටහන් ලියන්න.

(i) රජරට චෝල පාලනය

(ii) පළමුවන පරාක්‍රමබාහු රජතුමාගේ ආර්ථික කටයුතු

(iii) සීතාවක රාජධානිය

(iv) ඩොනමෝර් ආණ්ඩුක්‍රමය

*(ලකුණු 06 × 2 = 12 යි)*

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**2563 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2019 දෙසැම්බර්**

**(නව නිර්දේශය)**

**(07) ඉතිහාසය - II පත්‍රය**

**II** වන පත්‍රයේ ප්‍රශ්න අංක **1** (i) ට පිළිතුරු සැපයීම සඳහා මෙම සිතියම භාවිත කරන්න. පිළිතුරු සැපයීමෙන් පසුව මෙය ඔබේ පිළිතුරු පත්‍රය සමඟ අමුණා භාරදෙන්න.

**විභාග අංකය :** ..........................

**1** (i)

